# මාසික විවරණිකාව

## 2009 මාර්තු



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

# විවරණිකාව

**59 වැනි වෙළුම 03 වැනි කලාපය**

**2009 මාර්තු**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථකථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථායන්හිදී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේ දී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළ යුතුය.

**ISSN 1391 - 3654**

ප්‍රකාශය : ශ්‍රී ලංකා මහ බැංකුව

# පටුන

පිටුව


| | | |
|---|---|---|
| පළමුවැනි කොටස | - මාසික සිදුවීම් | 06 |
| දෙවැනි කොටස | - පුවත්පත් නිවේදන, පුවත්පත් දැනුවීම් සහ දේශන - 2009 මාර්තු | 07 |

1. මාස 30කට පසු 2009 පෙබරවාරි මාසයේ දී උද්ධමනය තනි අංකයක් දක්වා පහත වැටෙයි 07
2. සම්පස්ථ ණය පහසුකම යටතේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,900 ක මූල්‍යාධාර ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව සාකච්ඡාවන් අරඹයි 08
3. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර 09
4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2009 මාර්තු 09
5. 2009 ජනවාරි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය 10
6. සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් මුදල් සමාගම් හා කල්බදු සමාගම්වල ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග 11
7. මහ බැංකුව, වාණිජ බැංකුවල ණය දීම් වර්ධනය කිරීමට දිරිගන්වයි. 13
8. දිරිගැන්වීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සහ සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් ලියාපදිංචි මුදල් සමාගම්වල ස්ථායීතාවය පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු ආරම්භ කිරීම 13
9. උද්ධමනය වසර පහක් තුළ එහි අඩුතම අගය කරා ළඟා වෙයි 15
10. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) 2007, 2008 සහ 2009 16


## සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය

සංඛ්‍යා සටහන්

### නිෂ්පාදනය, වර්ෂාපතනය, යෙදවුම් සහ ආයෝජනය


| | | | |
|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය හා දළ ජාතික නිෂ්පාදිතය | ... | .... | 01 |
| කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශක | .... | .... | 02 |
| තේ, රබර් සහ පොල් නිෂ්පාදනය | .... | .... | 03 |
| වී නිෂ්පාදනය | .... | .... | 04 |
| වර්ෂාපතනය සහ වැසි දින ගණන් ප්‍රමාණය | ..... | .... | 05 |
| පොහොර නිකුතුව | ..... | .... | 06 |
| තෝරාගත් කාර්මික නිෂ්පාදන දර්ශක | ..... | .... | 07 |
| පෞද්ගලික අංශයේ කර්මාන්ත නිෂ්පාදන ප්‍රමාණ දර්ශකය | .... | .... | 08 |
| ආයෝජන මණ්ඩල ව්‍යවසායන්හි ආයෝජන, අපනයන සහ සේවා නියුක්තිය | .... | | 09 |


### පණිවුඩ හුවමාරුව, බලශක්තිය ප්‍රවාහන සහ නිවාස


| | | | |
|---|---|---|---|
| විදුලි සංදේශ සේවා | ..... | ..... | 10 |
| විදුලිබල උත්පාදනය සහ ඛනිජ තෙල් ආනයනය | .... | ..... | 11 |
| මගී ප්‍රවාහනය සහ වරාය ක්‍රියාකාරිත්වය | ..... | ..... | 12 |
| මෝටර් රථ නව ලියාපදිංචි කිරීම් | ..... | ..... | 13 |
| මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකය | ..... | ..... | 14 |


### මිල සහ වැටුප්


| | | | |
|---|---|---|---|
| කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය | ..... | ..... | 15 |
| මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය | ..... | ..... | 16 |
| ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය | ..... | ..... | 17 |
| කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය | ..... | ..... | 18 |
| තොග අලෙවි මිල දර්ශකය | .... | ..... | 19 |
| තෝරාගත් ආහාර ද්‍රව්‍ය කිහිපයක පිටකොටුව වෙළෙඳපොළෙහි තොග මිල ගණන් | | | 20 |
| තෝරාගත් ආහාර ද්‍රව්‍ය කිහිපයක නිෂ්පාදන සහ සිල්ලර මිල ගණන්වල සාමාන්‍යය | | | 21 |
| තෝරාගත් එළවළු, මාළු, පළතුරු හා කුකුළු ගොවිපළ නිෂ්පාදන වර්ග කිහිපයක සාමාන්‍ය නිෂ්පාදන මිල ගණන් | ..... | .... | 22 |
| තෝරාගත් එළවළු සහ මාළු වර්ග කිහිපයක සාමාන්‍ය සිල්ලර මිල ගණන් | | .... | 23 |
| උපයෝගි සේවා මිල ගණන් | ..... | .... | 24 |
| පඩි පාලක සභා කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක | ..... | .... | 25 |
| රජයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක | ..... | .... | 26 |
| මළු දිවයිනේ අසංවිධිත අංශයේ දෛනික වැටුප් | ..... | .... | 27 |
| ඉදිකිරීම් පිරිවැය දර්ශක | ..... | .... | 28 |
| තෝරාගත් ඉදිකිරීම් යෙදවුම් කිහිපයක මිල දර්ශක සහ කම්කරු වැටුප් දර්ශක | ..... | | 29 |

## රාජ්‍ය මූල්‍ය කටයුතු


ශුද්ධ මූල්‍ය අතිරික්තය (+)/හිඟය (-) ...... .... 30
රජයේ ආදායම ..... ..... 31
රජයේ වියදම - 2005 ..... ..... 32
රජයේ වියදම ..... ..... 33
නොපියවූ රාජ්‍ය ණය ..... ..... 34


## වෙළෙඳාම, ගෙවුම් තුලනය සහ සංචාරක ව්‍යාපාරය


අපනයන, ආනයන සහ වෙළෙඳ ශේෂය ..... ...... 35
අපනයන ..... ...... 36
කාර්මික සහ ඛනිජමය අපනයන සංයුතිය ..... ...... 37
තේ සහ රබර් - වෙන්දේසි සහ අපනයන ..... ...... 38
ප්‍රධාන පොල් නිෂ්පාදන - වෙන්දේසි සහ අපනයන ..... ...... 39
අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන - ප්‍රමාණය ..... ...... 40
අනෙකුත් කෘෂි නිෂ්පාදන අපනයන-වටිනාකම ..... ...... 41
ආනයන සංයුතිය ..... ..... 42
මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - අපනයන වටිනාකම ..... ..... 43
මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - ආනයන වටිනාකම ...... ..... 44
මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - අපනයන පරිමාව ...... ...... 45
මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - ආනයන පරිමාව ...... ...... 46
මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - අපනයන ඒකක වටිනාකම ..... ...... 47
මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - ආනයන ඒකක වටිනාකම ..... ...... 48
සංචාරක කර්මාන්තයේ මූලික දර්ශක ...... ...... 49
ගෙවුම් තුලනය - (රු.දශලක්ෂ) ...... ...... 50
ගෙවුම් තුලනය - (එ.ජ.ඩො. දශලක්ෂ) ...... ...... 51
විදේශීය සංචිත ...... ...... 52
ප්‍රධාන ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික සහ නාමික සඵල
විනිමය අනුපාතික සහ මූර්ත සඵල විනිමය අනුපාතිකවල මාසික දර්ශක අගයන් 53
අන්තර් බැංකු ඉදිරි වෙළෙඳපොළ ගනුදෙනු ..... ..... 54


## මූල්‍ය අංශය


මූල්‍ය සමස්තයන් ($M_2$) ...... ...... 55
මූල්‍ය සමීක්ෂණය (දේශීය බැංකු ඒකක) ...... ..... 56
මහ බැංකුවේ වත්කම් සහ වගකීම් ..... ..... 57
වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම් ..... ...... 58
විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි (වි.ව්‍ය.මු.බැ..ඒ.) වත්කම් සහ වගකීම්...... 59
ඒකාබද්ධ මූල්‍ය සමීක්ෂණය (වි.ව්‍ය.මු.බැ..ඒ. ඇතුළත්ව) ..... ..... 60
මූල්‍ය සමීක්ෂණය - ($M_4$) ..... ..... 61
වාණිජ බැංකුවල සංචිත තත්ත්වය ..... ..... 62
මහ බැංකුවේ ව්‍යවහාර මුදල් නිකුතුව (වටිනාකම අනුව) ..... .... 63
මුදල් අනුපාතික ..... ...... 64
රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික ..... ..... 65
බලපත්‍රලාභී වාණිජ බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි තැන්පතු සහ ණය ලබාදීමේ අනුපාතික 66
බලපත්‍රලාභී වාණිජ බැංකුවල පොලී අනුපාතික ..... ..... 67
බලපත්‍රලාභී වාණිජ බැංකුවල ගාස්තු සහ මුදල් අය කිරීම් ..... ..... 68
චෙක්පත් නිශ්කාෂණය සහ ශ්‍රී ලංකා මහ බැංකු ගෙවීම් පද්ධතිය ..... ..... 69
වාණිජ බැංකු හර සහ තැන්පතු පිරිවැටුම් ..... ..... 70
වාණිජ බැංකු වෙතින් පෞද්ගලික අංශයේ ඉල්ලුම්, කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු අයිතිය 71
අරමුණ සහ කල්පිරීමේ රටාව අනුව වර්ග කරන ලද වාණිජ බැංකු ණය සහ අත්තිකාරම් 72
ජාතික සංවර්ධන බැංකුවේ ඩී.එෆ්.සී.සී. බැංකුවේ සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය කටයුතු 73
වාණිජ බැංකු සහ අනෙකුත් වාණිජ බැංකු නොවන බලපත්‍රලාභී මූල්‍ය ආයතනවල
ඉතිරිකිරීම් සහ ස්ථාවර තැන්පතු ..... ..... 74
කොටස් වෙළෙඳපොළ කටයුතු ..... ..... 75

## 1 වන කොටස
# මාසික සිදුවීම්
## 2009 මාර්තු

### අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදලෙන් ලැබුණු ණය

කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා කුවේට් ඩිනාර් දශ ලක්ෂ 10 ක (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 3,899) ණය මුදලක් සඳහා 2009 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා රජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල ගිවිසුමකට අත්සන් කරන ලදී. මෙම ණය මුදල, වසර 6 ක සහන කාලයකට යටත්ව වසර 26 කින් ගෙවා නිම කළ යුතුය. ණය මුදල සඳහා වාර්ෂිකව පොලී ගෙවීම් වශයෙන් ණය මුදලෙන් සියයට 1.5 ක්, අනිවාර්ය ගෙවීම් වශයෙන් සියයට 0.5 ක් සහ ණය මුදල පරිපාලන හා ක්‍රියාත්මක කිරීමේ ගාස්තු වශයෙන් සියයට 0.5 ක් ගෙවිය යුතුය.

### ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානයෙන් ලැබුණු ප්‍රදාන

2008 මහ කන්නයේ දී උතුරු පළාතේ අවතැන් වූ හා නැවත පදිංචි වීමට පැමිණි පුද්ගලයින්, සත්කාරක පවුල් සහ අවදානමට ලක්වූ පවුල් සඳහා කඩිනම් සහනාධාර ලබාදීමට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 0.36 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 41) ක ප්‍රදානයක් සඳහා 2009 මාර්තු මස 11 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය ගිවිසුමකට අත්සන් තබන ලදී.

### ජපාන රජයෙන් ලැබුණු ප්‍රදාන

වරප්‍රසාද නොලත් ගොවීන්ගේ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා ජපාන යෙන් දශ ලක්ෂ 520 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 619) ක ප්‍රදානයක් වෙනුවෙන් එකඟතාව පළ කරමින් 2009 මාර්තු මස 19 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජපාන රජය ගිවිසුමකට අත්සන් තබන ලදී.

## II වන කොටස
# පුවත්පත් නිවේදන
### 2009 මාර්තු

## 1. මාස 30 කට පසු 2009 පෙබරවාරි මාසයේ දී උද්ධමනය තනි අංකයක් දක්වා පහත වැටෙයි.

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) (2002 100) ලක්ෂ්‍යමය වෙනස මත පදනම්ව මනිනු ලබන උද්ධමන අනුපාතය 2009 පෙබරවාරි මාසයේ දී සියයට 7.6 ක් වූ තනි අංකයක් දක්වා පහත බැස ඇත. මෙය 2006 පෙබරවාරි මාසයෙන් පසු වාර්තා වූ පහළම අගය වේ. ලක්ෂ්‍යමය වෙනස මත පදනම්ව මනිනු ලබන උද්ධමන අනුපාතය 2008 ජූනි මාසයේ දී වාර්තා කළ එහි ඉහළ ම අගය වූ සියයට 28.2 සිට අඛණ්ඩව පහත බසිමින් පවතී. උද්ධමනයේ වාර්ෂික සාමාන්‍යය ද තවදුරටත් අඩු වෙමින් ජනවාරි මාසයේ වූ සියයට 21.6 සිට පෙබරවාරි මාසයේ දී සියයට 20.3 ක අගයක් දක්වා පහත වැටිණි.*

කො.පා.මි.ද. 2009 ජනවාරි මාසය හා සසඳන විට පෙබරවාරි මාසයේ දී සියයට 0.1 ක පහත වැටීමක් දක්නට ලැබිණි. මෙම අඩු වීම කෙරෙහි ප්‍රවාහනය (සියයට 1.7) සහ ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග (සියයට 0.3) යන උප කාණ්ඩවල මිල පහත බැසීම දායක විය.

මූලික උද්ධමන අනුපාතය ලක්ෂ්‍යමය වෙනස මත ජනවාරි මාසයේ පැවති සියයට 15.5 සිට පෙබරවාරි මාසයේ දී සියයට 14.1 දක්වා පහත වැටුණ නමුත් වාර්ෂික සාමාන්‍ය අනුපාතය සියයට 14.3 සිට සියයට 14.8 දක්වා ඉහළ නැගිණි. විනෝදාත්මක හා සංස්කෘතික




කටයුතු (සියයට 6.9), සන්නිවේදනය (සියයට 2.7), අධ්‍යාපනය (සියයට 1.4) සහ නිවාස හා ජලය (සියයට 1.0) යන උප කාණ්ඩවල මිල මට්ටම් ඉහළ යාම හේතුවෙන් මාසික මූලික දර්ශකයෙහි සියයට 0.7 ක සුළු වැඩි වීමක් දක්නට ලැබිණි.

මූල්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් ලෙස හා ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි භාණ්ඩවල මිල ගණන් පහත වැටීම නිසා වසර මැද භාගය වන විට උද්ධමනය සියයට 3-4 වැනි අඩු අගයක් කරා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2. සම්පස්ථ ණය පහසුකම යටතේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,900 ක මූල්‍යාධාර ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව සාකච්ඡාවන් අරඹයි

*පවත්නා ගෝලීය මූල්‍ය අර්බුදය හමුවේ ශ්‍රී ලංකාවට අනුග්‍රහ දැක්වීම පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉදිරිපත් වීමට ප්‍රතිචාර වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාවට හිමි කොටසින් සියයට 300 ක් පමණ වූ, එනම් දළ වශයෙන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,900 ක සම්පස්ථ ණය පහසුකමක් ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය බලාපොරොත්තු වේ.*

2008 සැප්තැම්බර් මාසයේ දී උග්‍ර අතට හැරුනු ගෝලීය මූල්‍ය අර්බුදය, විශේෂයෙන්ම විදේශීය අංශයට සම්බන්ධ ආර්ථික දර්ශකයන් කිහිපයක පෙන්නුම් කළ වාසිදායක ප්‍රවණතාවයන්ට, අවාසිදායක ලෙස බලපෑ ආකාරය මෙම සාකච්ඡාවල දී ශ්‍රී ලංකා රජය විසින් පැහැදිලි කර දී ඇත. තවදුරටත්, ආසන්න වශයෙන් දශක තුනක් පුරා ශ්‍රී ලංකාව තුළ පැවැති ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය අවසානය කරා එළඹීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දැනුවත් වී ඇති අතර, යුද්ධය නිමා වීමේ ප්‍රතිඵලයක් වශයෙන් උතුරු පළාත තුළ නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ සහ නැගෙනහිර පළාතේ කඩිනම් සංවර්ධන වැඩ පිළිවෙළ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට විදේශීය ආධාරයන්හි දැඩි අවශ්‍යතාවයක් පැන නැගී ඇත. මෙය අනිවාර්යයෙන්ම දැරිය යුතු අත්‍යවශ්‍ය වියදමකි. එයට හේතුව වනුයේ දශක ගණනාවක් පුරා පැවති යුද්ධයෙන් පීඩාවට පත් වූ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට පමණක් නොව එසේම යුද්ධය සඳහා සර්වසාර විසඳුමක් ලබාදීමට රජය විසින් දරන ප්‍රයත්නයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ද එය උපකාරී වන බැවිනි. නැගෙනහිර පළාත තුළ සාමාන්‍ය ජන ජීවිතය සහ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති බවත්, එසේම උතුරු පළාත තුළ නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු අරඹා ඇති බවටත් රජය විසින් පෙන්වා දී ඇත.

මෙම ප්‍රවණතාවය තවදුරටත් පුළුල් සහ වැඩි දියුණු කළ යුතුය. එයට හේතුව වනුයේ මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීම මගින් යුද්ධයෙන් පීඩාවට පත් වූ සැමට සහනයක් සහ බලාපොරොත්තුවක් සැපයෙන බැවිනි. මෙවැනි ක්‍රියා මාර්ගයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන්නා වූ සාමය සහ සමාජ දේශපාලන ස්ථාවරත්වය තුළින් ආර්ථික සහ සමාජ ප්‍රතිලාභ රැසක් ලබාගත හැකි වනු ඇත. ප්‍රධාන වශයෙන්ම, කෘෂිකාර්මික සහ ධීවර අංශයන්ගේ දියුණුව සහ සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම තුළින් එවැනි ප්‍රතිලාභ ලැබෙනු ඇත.

පවත්නා ගෝලීය මූල්‍ය තත්ත්වයන් හමුවේ කිසිම රටකට අවශ්‍ය ප්‍රමාණයට විදේශීය මූල්‍යනයන් එක්රැස් කර ගැනීමට නොහැකි වූ අතර, ශ්‍රී ලංකාවට ද එම තත්ත්වයට මුහුණ දීමට සිදුවීම පිළිබඳව රජය විසින් තවදුරටත් පැහැදිලි කර දෙන ලදී. එමනිසා මෙම අවස්ථාවේ දී ගෙවුම් ශේෂය යහපත් කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ආධාර ලබා ගැනීම මගින් රටේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය ස්ථායී කිරීමට සහ ඉදිරි තත්ත්වයන්ට නිශ්චිතව සහ දැඩි විශ්වාසයෙන් යුතුව මුහුණ දීමට හැකියාව ලබාදෙනු ඇත. නව අවශ්‍යතාවයන් පියවීම සඳහා මෙන්ම ගෝලීය මූල්‍ය අර්බුදයන් නිසා ඇති වන ඕනෑම හිඩැසක් පිරවීම සඳහා මෙම ආධාර ප්‍රයෝජනවත් විය හැක.

2009 මාර්තු අවසානයේ දී සාකච්ඡාවන් නිම කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරන අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක කමිටුව මෙම ආධාර අනුමත කළ වහාම මෙම යෝජිත ආධාර මුදලින් සැලකිය යුතු කොටසක් මුලින්ම මුදා හරිනු ඇත. එසේම, එවන් මූල්‍ය අනුග්‍රහයක් ලබාගැනීම නිසා අනිකුත් සංවර්ධන පාර්ශවකරුවන්ගේ සහායයන් ලැබීම වර්ධනය වනවාසේම ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර ආයෝජකයින්ගේ විශ්වාසය සැලකිය යුතු ලෙස වැඩි වනු ඇත.

## 3. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර

*ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලසුම් ලද ආයෝජකයන් සඳහා හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය සමග තරගකාරී ලෙස තැබීම් තුළින් තීරණය වූ ආන්තික පොලී අනුපාතයන් යටතේ, දායකත්වය සැපයීම පිණිස ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම නිකුතුව 2009 මාර්තු 02 වැනි දින ආරම්භ කර 2009 මාර්තු 16 වැනි දින අවසන් කරන ලදී. වසර 02 ක පරිණත කාලයකින් යුත් එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ක වටිනාකමකින් යුත් බැඳුම්කර මෙසේ ඉදිරිපත් කරන ලදී.*

දේශීය හා විදේශීය වාණිජ බැංකු මේ සඳහා දායකත්වය සපයන ලදී. එක්සත් ජනපද ඩොලර් මිලියන 196.25 ක (ලංසු සඳහා ඉදිරිපත් කළ මුළු මුදලෙන් සියයට 98.1 ක) වටිනාකමකින් යුත් ලැබුණු මුළු ලංසු ප්‍රමාණයෙන්, වසර 02 ක පරිණත කාලයකින් යුත් එක්සත් ජනපද ඩොලර් මිලියන 184.25 ක ප්‍රමාණයක් හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය සහ සියයට 5.40 ක ප්‍රතිශතයක වෙළෙඳපොළ මගින් තීරණය වූ පොලී අනුපාතයක් යටතේ පිළිගැනීමට රජය තීරණය කරන ලදී. 2009 මාර්තු මස 17 දින එක්සත් ජනපද ඩොලර් හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සියයට 1.88 කි.

මෙම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව 2009 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික ණය ගැනුම් සීමාව තුළ පවතී.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පියවිසන් කර භාරදීමෙන් පසුව එය ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී වෙත ලියාපදිංචි කිරීමෙන් පැවරීම සිදු කළ හැකිය. සැලසුම් ලද ආයෝජකයින්ට ද්විතීයික වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද බලයලත් එජන්තවරුන්ගෙන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිල දී ගත හැකිය.

## 4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2009 මාර්තු

*2008 ජූලි මස සිට උද්ධමනය සැලකිය යුතු ලෙස පහත වැටීමෙන් ආර්ථිකයෙහි උද්ධමන පීඩනයන් බොහෝදුරට සමනය වී ඇති බව පෙනී යයි. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස, 2008 අග පැවති සියයට 14.4 සිට 2009 පෙබරවාරි අග වන විට සියයට 7.6 දක්වා තනි ඉලක්කමක මට්ටමට පහත බසින ලදී. ආර්ථිකයේ ඉල්ලුම් පීඩන සීමා කිරීමේ සහ විදේශීය මෙන්ම දේශීය සැපයුම් අංශයන්හි ඇති වූ හිතකර වර්ධනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස උද්ධමනයෙහි මෙම පහත බැසීමේ ප්‍රවණතාව තවදුරටත් පැවතිය හැකියි ද, ඒ අනුව, උද්ධමනය මෙම වසර තුළ තනි ඉලක්කමක මට්ටම තුළ පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. 2009 වසර තුළ උද්ධමනයෙහි සාමාන්‍යය ද සියයට 10 ට වඩා අඩු අගයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.*

උද්ධමනයෙහි හා උද්ධමන පෙරදැක්මෙහි ඇති වූ වර්ධනයන්ට සාපේක්ෂව වෙළෙඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් පහත වැටීමට ඉඩ සලසමින් මහ බැංකුව තම ප්‍රතිපත්ති ස්ථාවරය වෙනස් කර ඇත. මෙම ප්‍රතිපත්ති ස්ථාවරයට අනුරූපීව මහ බැංකුව සමග සිදු කරන ලබන ප්‍රතිවිකුණුම් ගනුදෙනු මත පනවා තිබූ දඩ පොලී අනුපාතිකය අවස්ථා දෙකක දී පදනම් අංක 250 කින් ද, ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික පදනම් අංක 25 බැගින් ද පහත දමන ලදී. වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් මත පනවා තිබූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ද, වෙළෙඳපොළ ද්‍රවශීලතාවය වර්ධනය කිරීමේ අරමුණින් 2008 ඔක්තෝබර් සිට අවස්ථා තුනක දී සියයට 10 සිට සියයට 7 දක්වා පහත හෙළන ලදී.

වෙළෙඳපොළ පොලී අනුපාතික තව දුරටත් පහත යෑමේ අවශ්‍යතාව පිළිබිඹු කරමින් මහ බැංකුව සමග සිදු කරන ලබන ප්‍රතිවිකුණුම් ගනුදෙනු මත පනවා තිබූ දඩ පොලී අනුපාතිකය වහාම බලපැවැත්වෙන පරිදි සියයට 14.75 දක්වා පදනම් අංක 175 කින් තව දුරටත් අඩු කිරීමට මහ බැංකුව තීරණය කර ඇත. වෙළෙඳපොළෙහි ඇති වන ද්‍රවශීලතා හිඟයන් ද මහ බැංකුව විසින් තම විවෘත වෙළෙඳපොළ කටයුතු තුළින් ද්‍රවශීලතාවය ලබා දීමෙන් සීමා කරන ඇත. තවද, මහ බැංකුව විසින් 2008 ඔක්තෝබර් අග සහ නොවැම්බර් ආරම්භයේ දී ඇතුම් අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා ණයවර ලිපි ආරම්භ කිරීමේ දී සහ ලියවිලිවලට එරෙහිව ප්‍රතිග්‍රහණය යන පදනමට සිදු කරන ලද ආනයන මත පනවා තිබූ ආන්තික අවශ්‍යතාවයන් ඉවත් කිරීමට තීරණය කර ඇත. මෝටර් රථ ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීම මත පනවා තිබූ තැන්පතු අවශ්‍යතාවය 2008 ඔක්තෝබර් මස සියයට 200 දක්වා ඉහළ නැංවූ අතර, මෙය නැවත සියයට 100 දක්වා වහා බලපැවැත්වෙන පරිදි අඩු කොට ඇත.

ප්‍රතිපත්තිමය පොලී අනුපාතික පහත හෙළීම සහ වෙළෙඳපොළට ද්‍රවශීලතාවය නිකුත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය වෙළෙඳපොළ පොලී අනුපාතික පහත බැසීමේ පැහැදිලි ප්‍රවණතාවක් පෙන්නුම් කොට ඇත. භාණ්ඩාගාර බිල්පත් සඳහා වන ඵලදා අනුපාතික, 2008 අග සිට පදනම් අංක 140-190 ත් අතර පරතරයකින් පහත බැස ඇත. බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය ද 2009 මාර්තු දෙවන සතියේ දී සියයට 18.27 දක්වා අඩු වී ඇති අතර, මෙය 2009 වසර තුළ දී මෙතෙක් සඳහන් වූ අඩුම අගය වේ. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කිරීම තුළින් මූල්‍ය අතරමැදියන්ට තම ණයදීම් කටයුතු වඩාත් වර්ධනය කර ගැනීමට පෙළඹවීමක් ඇතිවනු ඇතැයි ද, මේ තුළින්, වඩාත් අඩු පොලී අනුපාතිකවලට ආර්ථිකය වෙත ණය අරමුදල් ලබාදෙනු ඇතැයි ද මහ බැංකුව අපේක්ෂා කරයි. මේ තුළින් දේශීය ඉල්ලුම වර්ධනය වී ආර්ථික කටයුතුවලට අනුබලයක් ලැබෙනු ඇත.

මීළඟට නියමිත ප්‍රතිපත්ති ප්‍රකාශය, 2009 අප්‍රේල් 22 වන දින නිකුත් කිරීමට නියමිතය.

## 5. 2009 ජනවාරි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය

*පෙර වර්ෂය සමග සසඳනවිට 2009 ජනවාරි මාසයේ දී වෙළෙඳ ගිණුමේ හිඟය සියයට 66.5 කින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 208 දක්වා අඩු වූ අතර මේ සඳහා වෙළෙඳ පරිමාව අඩුවීම බලපාන ලදී. 2009 ජනවාරි මාසයේ දී අපනයන එ.ජ.ඩොලර් 491 දක්වා සියයට 11.6 කින් පහත වැටුණු අතර ආනයන ද එ.ජ.ඩොලර් දශ ලක්ෂ 699 දක්වා සියයට 40.5 කින් පහත වැටුණි. භාණ්ඩ මිලෙහි සිදු වූ තියුණු පහත වැටීමෙන් කෘෂිකාර්මික සහ කාර්මික යන දෙඅංශයටම බලපෑම් ඇති වූ අතර, එය අපනයන ඉපැයුම් පහත වැටීම සඳහා දායක විය. ගෝලීය ආර්ථික පසුබැසීමත් සමග ඉල්ලුම අඩුවීම අපනයන පරිමාවට බලපෑම් ඇති කළේය. 2009 ජනවාරි මාසයේ අපනයන පහත වැටීමට සියයට 50 කට වඩා වැඩි දායකත්වයක් කෘෂිකාර්මික අපනයන තුළින් සැපයීය. තේ සහ රබර් මිල පිළිවෙළින් සියයට 9.7 සහ 45.9 වශයෙන් පහත වැටුණි. කෙසේ වුවත්, විදේශීය ඉල්ලුම අඩු වී තිබියදීත් රෙදිපිළි හා ඇඟළුම් අපනයන සියයට 4.5 කින් වර්ධනය වීමෙන් අපනයන ධෛර්යමත් කරනු ඇත. එහෙත් කාර්මික අංශයේ අනෙකුත් උප අංශයන් තුළ ඇති වූ වැටීම සම්පූර්ණයෙන් මගහරවා ගැනීම සඳහා එය ප්‍රමාණවත් නොවීය. සමස්තයක් වශයෙන් සැලකූ විට, කාර්මික අපනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 385 දක්වා සියයට 5.2 කින් පහත වැටුණි.*

2009 ජනවාරි මාසයේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 699 දක්වා සියයට 40.5 කින් පහත වැටුණි. මෙම පහත වැටීමට සියයට 40 කට වඩා වැඩි දායකත්වයක් දක්වමින් ඛනිජතෙල්, ආනයන අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2008 ජනවාරි මාසයේ දී එ.ජ.ඩොලර් 92.71 ක් ව පැවැති බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල 2009 ජනවාරි මාසයේ දී එ.ජ.ඩොලර් 41.71 දක්වා සියයට 55 කින් පහත වැටුණි. 2009 ජනවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ සහ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ද පිළිවෙළින් සියයට 42.1 සහ සියයට 23.6 බැගින් පහත වැටුණි. වැඩිවන ගෝලීය ආර්ථික අර්බුදයට ප්‍රතිචාරයක් ලෙස විදේශීය වෙළෙඳාමේ දැනට පවත්නා ප්‍රවණතාව 2009 වසරේ වැඩි කාලයක් තුළ ද පවතිනු ඇත.

2008 ජනවාරි මාසයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 274 ක් ලෙසින් වාර්තා වූ පෞද්ගලික ප්‍රේෂණ 2009 ජනවාරි මාසයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 256 ක් දක්වා සියයට 6.6 කින් පහත වැටුණි. පෞද්ගලික ප්‍රේෂණයන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් එ.ජ.ඩොලරයට එරෙහිව තියුණු ලෙසින් අවප්‍රමාණය වූ ස්ටර්ලිං පවුම්, යූරෝ, ඕස්ට්‍රේලියානු ඩොලර් සහ කොරියානු වොන්වලින් සමන්විත වූ අතර, එක්සත් ජනපද ඩොලර්වලින් සලකා බැලූ විට ප්‍රේෂණ පහත වැටීමට දායක වී ඇත. 2009 ජනවාරි මාසයේ වෙළෙඳ හිඟයෙන් මෙන් සියයට 123 ක් වූ ප්‍රේෂණ ජංගම ගිණුමේ ශේෂය මත ඇති වූ පීඩනය අඩු විය. දැනට පවතින සහ අපේක්ෂිත වර්ධනයන් සැලකිල්ලට ගෙන ඇතැම් අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා 2008 ඔක්තෝබර් මාසයේ දී පනවන ලද සියයට සියයක

ආනතික තැන්පතු අවශ්‍යතාවය ඉවත් කළ අතර, මෝටර් රථවල ඇතැම් කාණ්ඩයන් සඳහා ආනතික තැන්පතු අවශ්‍යතාවය සියයට 200 සිට සියයට 100 දක්වා අඩු කරන ලදී. 2009 අඩු වෙළෙඳමක් හා ජංගම ගිණුමේ හිඟයක් ඇති කරමින් මෙම නැඹුරුව 2009 වසර මුළුල්ලේම පවතින ඇතැයි අපේක්ෂා කරන අතර එය විදේශ විනිමය වෙළෙඳපොළේ පවතින පීඩනය අඩු කරනු ඇත.

2009 ජනවාරි මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය ආසියානු නිශ්කාෂණ සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව පිළිවෙළින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,703 ක් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,145 ක් වාර්තා කළේය. පසුගිය මාස දෙළහ තුළ දී මාසයකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,128 ක් වූ සාමාන්‍ය ආනයනයන්ට අනුව මෙම සංචිත අගයන් පිළිවෙළින් මාස 1.5 ක් සහ 1.3 ක ආනයන සඳහා ප්‍රමාණවත් වේ. කෙසේ වුවත් බනිජ තෙල් සහ බනිජ තෙල් නිෂ්පාදන ආනයන වියදමෙහි තියුණු අඩුවීම හේතුකොට ගෙන ඉදිරි මාසවල දී ආනයන බොහෝදුරට අඩුවනු ඇතැයි අපේක්ෂා කරන අතර මේ නිසා සැබෑ වශයෙන් ආනයන මූල්‍යනය කළ හැකි මාස ගණන මීට වඩා වැඩි වනු ඇත.

මෙම කාල පරිච්ඡේදය සඳහා විදේශ වෙළෙඳමෙහි ක්‍රියාකාරීත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත.

**විදේශ වෙළෙඳමෙහි සහ පෞද්ගලික ප්‍රේෂණවල ක්‍රියාකාරීත්වය - 2009 ජනවාරි**

| කාණ්ඩය | 2008 ජනවාරි එ.ජ.ඩොලර් දශ ලක්ෂ | 2009 ජනවාරි එ.ජ.ඩොලර් දශ ලක්ෂ | ජනවාරි වර්ධනය % |
|---|---|---|---|
| **අපනයන** | **555.3** | **491.1** | **-11.6** |
| මෙයින් කෘෂිකාර්මික | 134.1 | 101.0 | -24.7 |
| මෙයින් තේ | 90.8 | 61.5 | -32.3 |
| කාර්මික | 406.0 | 385.1 | -5.2 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 230.2 | 240.6 | 4.5 |
| ඛනිජ ද්‍රව්‍ය | 15.3 | 5.1 | -66.8 |
| **ආනයන** | **1,175.2** | **698.8** | **-40.5** |
| මෙයින් පාරිභෝගික භාණ්ඩ | 201.2 | 153.8 | -23.6 |
| අන්තර් භාණ්ඩ | 659.5 | 356.9 | -45.9 |
| මෙයින් ඛනිජ තෙල් | 301.2 | 103.6 | -65.6 |
| ආයෝජන භාණ්ඩ | 305.1 | 176.7 | -42.1 |
| **වෙළෙඳ ශේෂය** | **-619.8** | **-207.7** | **-66.5** |
| **පෞද්ගලික ප්‍රේෂණ** | **274.0** | **256.0** | **-6.6** |

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

## 6. සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් මුදල් සමාගම් හා කල්බදු සමාගම්වල ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

*බැංකු, මුදල් ව්‍යාපාර සහ කල්බදු ව්‍යාපාර අංශයන් සඳහා, 2009 පෙබරවාරි 25 දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද දිරි ගැන්වීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගෙන ඇත. ඒ අනුව, දිරිගැන්වීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමටත් ලියාපදිංචි මුදල් සමාගම් සහ කල්බදු මූල්‍යකරණ සමාගම්වල ස්ථායීතාව පවත්වා ගැනීමටත් දැනට පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.*

1. ඉඩකඩම් හා දේපළ විකිණීමට සහ බලපත්‍රලාභී බැංකු සහ අනුමත ණය දෙන ආයතනවලින් ලබාගන්නා පහසුකම් සඳහා රජයේ ඇපකර නිකුත් කිරීමට අවශ්‍ය මෙහෙයුම් උපදෙස් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනටමත් පිළියෙළ කර ඇති අතර එම උපදෙස් ලියාපදිංචි මුදල් සමාගම් සහ කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත මෙම සතිය තුළ නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

2. කැබිනට් මණ්ඩල තීරණයට අනුව ප්‍රවීන උපදේශක මණ්ඩලයක් පත්කොට ඇති අතර, ආරම්භක අවස්ථාවේ දී මෙම මණ්ඩලය පහත සඳහන් පුද්ගලයන්ගෙන් සමන්විත වනු ඇත.

    (අ) නිශාන් ප්‍රනාන්දු මයා, වරලත් ගණකාධිකාරී, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති.

    (ආ) අරිත වික්‍රමනායක මයා, නීතිඥ, නිත්‍ය පාට්නර්ස් ප්‍රමුඛ හවුල්කරු සහ සුරැකුම් හා විනිමය කොමිසමේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්.

    (ඇ) එච්.එම්.හේරත්නායක බණ්ඩාර මයා, වරලත් ගණකාධිකාරී, ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ සභාපති සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අතිරේක සාමාන්‍යාධිකාරී.

    (ඈ) අජිත් දේවසුරේන්ද්‍ර මයා, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමයේ හිටපු සභාපති සහ බ්‍රවුන්ස් සමූහ ව්‍යාපාරයේ නියෝජ්‍ය සභාපති.

    කරුණු අටකින් සමන්විත දිරිගැන්වීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමට මෙන්ම, ලියාපදිංචි මුදල් හා කල්බදු මූල්‍යකරණ සමාගම් යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා ප්‍රවීන උපදේශක මණ්ඩලය විසින් අවශ්‍ය උපදෙස් ලබා දෙන අතර ඒ සඳහා කිසිදු ගාස්තුවක් අය නොකරන බව දැනුම් දී ඇත.

3. සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් ලියාපදිංචි මුදල් සමාගම් පහක් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකු විසින් පහත සඳහන් විශේෂිත ක්‍රියාමාර්ග ගෙන ඇත.

**(අ) ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී**

- ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී හි කළමනාකරණ නියෝජිතයා වශයෙන් පත්කර ඇති අතර මෙම සමාගමේ කටයුතු ප්‍රවීන උපදේශක මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව සිදුකෙරෙන ඇත.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමස්ත කළමනාකරණ කටයුතු ඉටුකිරීම සඳහා විධායක නිලධාරීන් කිහිප දෙනෙකු පත්කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් ද, විධායක තනතුරු, ඔවුන්ගෙන් ඉවත් කොට ඇත.

- ප්‍රවීන උපදේශක මණ්ඩලය දැනටමත් තම කටයුතු ආරම්භ කර ඇති අතර, මෙම ආයතන සම්බන්ධයෙන් කළ යුතු මැදිහත්වීම් සඳහා කඩිනම් පියවර ගෙන ඇත.

- පරිපාලන හා මෙහෙයුම් වියදම් සැලකිය යුතු ලෙස අඩුකර ගැනීමට සමාගම දැනටමත් පියවර ගෙන ඇති අතර, සමාගම සතු වත්කම් සම්බන්ධිත පාර්ශව සමාගම් වෙත පැවරීම් නොකරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමාගමට විධානය කර ඇත.

- සමාගමේ ස්ථාවරත්වය තහවුරු කර ගැනීම සඳහා, සේවක මණ්ඩලය ස්වේච්ඡාවෙන සිය වියදම් අඩු කර ගැනීමට කටයුතු කරන බවට වෘත්තීය සමිති මගින් ඔවුන්ගේ අභිමතය පළකර ඇත.

**(ආ) ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පැනි ලිමිටඩ්**

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී සමාගම, ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පැනි ලිමිටඩ් සමාගම සමග කළමනාකරණ ගිවිසුමකට එළඹ ඇති අතර, ඒ අනුව, ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පැනි ලිමිටඩ් සමාගමේ ක්‍රියාකාරිත්වය, කළමනාකරණය හා අධීක්ෂණ කටයුතු මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී සමාගම විසින් සිදු කරන ඇත.

**(ඇ) සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියල්ටි ලිමිටඩ්**

සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියල්ටි ලිමිටඩ් හි කළමනාකරණ නියෝජිතයා වශයෙන් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව පත්කොට ඇති අතර, මෙම සමාගමේ කටයුතු ප්‍රවීන උපදේශක මණ්ඩලයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව සිදුකෙරෙන ඇත.

**(ඈ) එෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්**

එෂියන් ෆිනෑන්ස් ලිමිටඩ් හි කළමනාකරණ නියෝජිතයා වශයෙන් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව පත්කොට ඇති අතර, මෙම සමාගමේ කටයුතු ප්‍රවීන උපදේශක මණ්ඩලයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව සිදුකෙරෙන ඇත.

**(ඉ) සෙලාන් මර්චන්ට් ලීසිං එල්පීසී**

සෙලාන් මර්චන්ට් ලීසිං පීඑල්සී සමාගමෙහි, සියයට 81 ක් පමණ වන සෙලාන් මර්චන්ට් බැන්ක් පීඑල්සී සමාගමට අයත් කොටස් පීපල්ස් ලීසිං කම්පැනි පීඑල්සී වෙත පැවරා දීමට සෙලාන් මර්චන්ට් බැන්ක් පීඑල්සී සමාගම තීරණය කොට ඇත.

ඉහත සමාගම්හි පවතින ගැටලු සම්බන්ධව, තැන්පත්කරුවන් ගතහැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මෙන්ම මූල්‍ය ආයතනවලින් අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා ද ප්‍රවීන උපදේශක මණ්ඩලය විසින් ඒ ඒ සමාගම්හි කළමනාකරණ මණ්ඩලවලට අවශ්‍ය උපදෙස් ලබාදෙන ඇත.

ඉහත ක්‍රියාමාර්ග සහ එම ක්‍රියාමාර්ග කඩිනමින් හඳුන්වා දීම තුළින්, සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් ඉහත සමාගම් මෙන්ම, සමස්ත මුදල් සහ කල්බදු මූල්‍යකරණ අංශයන් කෙරෙහි මහජන විශ්වාසය තහවුරු වීමට ඉවහල් වන ඇතැයි අපේක්ෂා කරමු.

4. කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇති දිරිගැන්වීමේ යෝජනාවලියේ සඳහන් නැවත අත්පත් කරගෙන ඇති වාහන සහ උපකරණ සම්බන්ධයෙන් වූ තීරණය පරිදි, ලියාපදිංචි මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අත්පත් කරගෙන මේ දක්වා අලෙවි කර නොමැති චංචල දේපළ පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, 2009 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ඒවා අත්පත් කර ගන්නා අවස්ථාවේ දී කල්බදුකරු හෝ කුලී සින්නක්කර ගැනුම්කරු වූ තැනැත්තාට නැවත ලබාගැනීමට අවස්ථාවක් ලබාදිය යුතුය.

   (අ) එසේ නැවත ලබා ගැනීමට අවස්ථාව ලබා දුන් දින සිට මාසයක් ඇතුළත, එම කල්බදු ගැනුම්කරු හෝ කුලී සින්නක්කර ගැනුම්කරුවිසින් සමාගම සමග නව ගිවිසුමකට එළඹිය යුතුය.

   (ආ) ලියාපදිංචි මුදල් සමාගම් හෝ කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ගැනුම්කරුගෙන් දඩ පොලී හෝ ඒ හා සමාන අය කිරීම් නොකළ යුතුය.

   (ඇ) ලියාපදිංචි මුදල් සමාගම් හෝ කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ගැනුම්කරුගෙන් එම දේපළ අත්පත් කර ගැනීමේ ගාස්තු, ගබඩා කිරීමේ හෝ නවතා තැබීමේ ගාස්තු වැනි ද අය නොකළ යුතුය.

   (ඈ) ලබාගෙන ඇති පහසුකම්වලින් හිඟ වාරික ඇතුළු නොගෙවා ඉතිරිව ඇති සමස්ත ශේෂයෙන් සියයට 25 ක්, වත්කම නැවත පවරා ගන්නා අවස්ථාවේ දී කල්බදු ගැනුම්කරු හෝ කුලී සින්නක්කර ගැනුම්කරු විසින් ගෙවිය යුතු අතර, ඉතිරි ප්‍රමාණය, මුදල් සමාගම හෝ කල්බදු මූල්‍යකරණ සමාගම විසින් පනවන ලබන සාමාන්‍ය කොන්දේසීන්ට යටත්ව වර්ෂ දෙකක් ඇතුළත ගෙවීමට පහසුකම් සැලසිය යුතුය.

මෙම ක්‍රියාමාර්ග මගින්, මෙම වත්කම් නැවතත් ඵලදායී කටයුතුවල යොදා ගැනීමට ඉඩකඩ සැලසෙන අතර එය රටේ ආර්ථික කටයුතුවලට දායකත්වයක් සපයයි.

## 7. මහ බැංකුව, වාණිජ බැංකුවල ණය දීම් වර්ධනය කිරීමට දිරිගන්වයි.

*උද්ධමනයෙහි මෙන්ම උද්ධමන අපේක්ෂාවන්හි ශීඝ්‍ර පහත බැසීමට අනුකූලව මහ බැංකුව තම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමටත් වෙළෙඳපොළ ද්‍රවශීලතාව වර්ධනය කිරීමටත් ක්‍රියාමාර්ග කිහිපයකම ගෙන ඇත.*

මහ බැංකුව සමග සිදු කරනු ලබන ප්‍රතිවිකුණුම් ගනුදෙනු මත අය කරනු ලබන දඬ පොලී අනුපාතිකය මුලින් පැවති සියයට 19 මට්ටමේ සිට ක්‍රමයෙන් සියයට 14.75 දක්වා අඩු කරන ලදී. තවද, මහ බැංකුවෙහි ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික ද සියයට 10.25 හා සියයට 11.75 දක්වා පදනම් අංක 25 කින් පහත දමන ලදී. මෙයට අමතරව වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් මත පනවා ඇති ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ද 2009 ජනවාරි වන විට පදනම් අංක 300කින් සියයට 7 දක්වා පහත දමමින් වෙළෙඳපොළට නව ද්‍රවශීලතාවය මුදා හරින ලදී. එමෙන්ම වාණිජ බැංකු විසින් ඕනෑම අවස්ථාවක මහණ දෙනු ලබන ද්‍රවශීලතා හිඟයන් ද එක් දින, දිගුකාලීන හා ස්ථාවර යන පදනම් මත මහ බැංකුව විසින් විවෘත වෙළෙඳ කටයුතු මාර්ගයෙන් ද්‍රවශීලතාවය සැපයීම මගින් පියවනු ලබයි. ඉහත ක්‍රියාමාර්ග තුළින් මහ බැංකුවෙහි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ප්‍රවේශම්කාරීව ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඒකෂණ මුදල් හා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර පොලී අනුපාතික පහත බැස ඇත. ඒකෂණ මුදල් වෙළෙඳපොළ සාමාන්‍ය පොලී අනුපාතිකය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමට පෙර පැවති සියයට 17 - 19 මට්ටමේ සිට වර්තමානයේ සියයට 12 පමණ මට්ටමට පහත බැස ඇත. තවද, 2008 අග සිට භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික පදනම් අංක 170 - 240 අතර මට්ටමකින් පහත බැස ඇත. මෙම ක්‍රියාමාර්ග තුළින් රටෙහි සියලු පොලී අනුපාතික මත සැලකිය යුතු බලපෑමක් ඇතිවනු ඇතැයි ද, එමගින් මැදිකාලීන ආර්ථික වර්ධනය හා උද්ධමන පුරෝකථනයන්ට ගැළපෙන මට්ටමක පෞද්ගලික අංශයට දෙනු ලබන ණයෙහි වර්ධනය පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

කෙසේ වුවද, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමට අනුකූලව වාණිජ බැංකු විසින් ප්‍රමාණවත් ප්‍රතිචාර දක්වා නොමැති බව මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමක් පැවතියදීත් පෞද්ගලික අංශයට දෙන ලද ණයෙහි වර්ධනය 2008 අග පැවති සියයට 7.9 සිට 2009 ජනවාරි වන විට සියයට 6.4 දක්වා තියුණු ලෙස පහත බැස ඇත. එම නිසා පෞද්ගලික අංශයට නොඅඩුව ණය ලැබීම් සහතික කරනු වස් වාණිජ බැංකුවල ණයදීම් කටයුතු හැකි ඉක්මණින් වර්ධනය කරන ලෙස මහ බැංකුව වාණිජ බැංකුවලින් ඉල්ලා සිටින අතර, එය රටේ ආර්ථික කටයුතු පවත්වාගෙන යාමට උපකාරී වෙමින් ඒ අනුව ආර්ථිකයට ඇතිවිය හැකි අයහපත් ප්‍රතිවිපාක වළක්වනු ඇත.

## 8. දිරිගැන්වීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සහ සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් ලියාපදිංචි මුදල් සමාගම්වල ස්ථායීතාවය පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු ආරම්භ කිරීම

*2009 පෙබරවාරි 25 දින, බැංකු, මූල්‍ය ව්‍යාපාර සහ කල්බදු ව්‍යාපාර අංශයන් සඳහා කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද, දිරිගැන්වීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනට කටයුතු කරමින් සිටී. මේ අනුව, කරුණු 8 කින් සමන්විත දිරිගැන්වීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා පසුගිය සතිය තුළ පහත සඳහන් පියවරයන් ගෙන ඇත.*

1. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම යෝජනාවලිය ක්‍රියාත්මක කරනු ලබන බැංකුවක් ලෙස සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව පත්කර ඇති අතර, ලියාපදිංචි මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සතු ඉඩම් මෙම වැඩසටහන යටතේ විකිණීමේ දී අනුගමනය කළ යුතු මෙහෙයුම් උපදෙස් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් පිළියෙළ කොට ඇත. මේ අනුව, මෙම දිරිගැන්වීමේ යෝජනාවලිය යටතේ සහන බලාපොරොත්තු වන ලියාපදිංචි මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට ඉතා කෙටි කාලයක් තුළ මෙම වැඩසටහනට ප්‍රවිෂ්ට විය හැකිය.

2. ලියාපදිංචි මුදල් සමාගම් විසින් කාලීන තැන්පතු හා ඉතුරුම් තැන්පතු ශේෂයන් මත පවත්වා ගතයුතු ද්‍රවශීලතා අනුපාතයන් පිළිවෙළින් සියයට 15 ක හා සියයට 20 ක ප්‍රමාණයක සිට පිළිවෙළින් සියයට 10 හා සියයට 15 දක්වා ප්‍රමාණයකට අඩු කිරීම සඳහා අනුමැතිය ලබාදීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරන බව ලියාපදිංචි මුදල් සමාගම් වෙත දන්වා ඇත.

3. නව යෝජනාවලිය යටතේ පහසුකම් හා සහනයන් අපේක්ෂා කරන ලියාපදිංචි මුදල් සමාගම් හා කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා අදාළ වන කොන්දේසි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති අතර,

(අ) සම්බන්ධිත පාර්ශ්ව සමාගම් වෙත අරමුදල් සැපයීමෙන් වැළකීම,

(ආ) අධ්‍යක්ෂවරුන්ට හා ප්‍රධාන කළමනාකරුවන් වෙත කරන සියලුම ගෙවීම් හා දිරිදීමනා සීමා කිරීම, සහ

(ඇ) වාර්තා සැපයීමේ නව ආකෘතීන් සහ කාලපරාසයන් හඳුන්වාදීම යනාදිය මීට ඇතුළත්ය.

4. නැවත අතපත් කර ගෙන ඇති රථවාහන හා උපකරණ වහාත් ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා මුල් අයිතිකරුවන් වෙත පවරා දීමට කැබිනට් මණ්ඩල ගත් තීරණය බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනට අවශ්‍ය මෙහෙයුම් උපදෙස් පිළියෙළ කරමින් සිටී. මෙම උපදෙස් පිළියෙළ කිරීම 2009 මාර්තු 14 දිනට අවසන් කොට නිවේදනය කිරීමට අපේක්ෂිතය.

5. කැබිනට් මණ්ඩල තීරණයට අනුව, ප්‍රවීණ උපදේශක මණ්ඩලයක් මේ සඳහා පත් කොට ඇති අතර, ආරම්භක අවස්ථාවේ දී මෙම මණ්ඩලය පහත සඳහන් පුද්ගලයින්ගෙන් සමන්විත වන ඇත.

(අ) නිශාන් ප්‍රනාන්දු මයා, වරලත් ගණකාධිකාරී, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති.

(ආ) අරිත වික්‍රමනායක මයා, නීතිඥ, නිතා පාට්නර්ස් ප්‍රමුඛ හවුල්කරු සහ සුරැකුම් හා විනිමය කොමිසමේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්.

(ඇ) එච්.එම්.හේනනායක බණ්ඩාර මයා, වරලත් ගණකාධිකාරී, ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ සභාපති සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අතිරේක සාමාන්‍යාධිකාරී.

(ඈ) අජිත් දෙවසුරේන්ද්‍ර මයා, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමයේ හිටපු සභාපති සහ බ්‍රවුන්ස් සමූහ ව්‍යාපාරයේ නියෝජ්‍ය සභාපති.

කරුණු අංකිත සමන්විත දිරිගැන්වීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවීණ උපදේශක මණ්ඩලය විසින් අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදෙන ඇත.

6. සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් ලියාපදිංචි මූල්‍ය සමාගම් හතරක් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් විශේෂිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

**(අ) ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පැනි ලිමිටඩ්**

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී පොදු සමාගමට, ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පැනි ලිමිටඩ් සමාගම සමග කළමනාකරණ ගිවිසුමකට එළඹීමට අවසර ලබා දී ඇති අතර ඒ අනුව, ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පැනි ලිමිටඩ් සමාගමෙහි කළමනාකරණ හා අධීක්ෂණ කටයුතු මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී සමාගම විසින් සිදුකරන ඇත.

**(ආ) සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියල්ටි ලිමිටඩ්**

සුදුසු කළමනාකරණ නියෝජිතයෙක් සම්බන්ධ කර ගැනීම සඳහා දැනට සාකච්ඡා පැවැත්වෙන අතර, එම සාකච්ඡාවල ප්‍රගතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සමීපව අධීක්ෂණය කරන ඇත.

**(ඇ) එෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්**

සුදුසු කළමනාකරණ නියෝජිතයෙක් සම්බන්ධ කරගැනීම සඳහා දැනට සාකච්ඡා පැවැත්වෙන අතර, එම සාකච්ඡාවල ප්‍රගතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සමීපව අධීක්ෂණය කරන ඇත.

**(ඈ) ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම සමාගමේ සමස්ත කළමනාකරණ වගකීම පැවරිය හැකි විධායක නිලධාරීන් කිහිප දෙනෙක් හඳුනා ගෙන ඇති අතර, ඉදිරි දින දෙක තුළ මෙම පත්කිරීම සිදුකිරීමට නියමිතය. ප්‍රධාන වශයෙන්, මෙම ආයතනයේ පවතින තත්ත්වය තක්සේරු කර ගැනීමෙන් පසු, තෝරා ගන්නා ලද කළමනාකරණ මඬුල්ල විසින්, ප්‍රවීන උපදේශක මණ්ඩලයේ උපදෙස් හා මගපෙන්වීම අනුව අවශ්‍ය මැදිහත්වීම් කඩිනමින් සිදුකරන ඇත.

තවදුරටත් මෙම සමාගම්වල මතුවී ඇති තත්ත්වයන් පිළිබඳව, මෙම යෝජනාවලිය ක්‍රියාත්මක කරන බැංකුව විසින් සපයන ලබන මූල්‍ය සහනයන්ට අතිරේකව, අදාළ සමාගම්වල කළමනාකරණ මණ්ඩලය විසින් ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව ප්‍රවීන උපදේශක මණ්ඩලය විසින් අවශ්‍ය උපදෙස ලබා දෙන ඇත.

7. ඉහත ක්‍රියාමාර්ග සහ ක්ෂණිකව හඳුන්වා දිය හැකි නව ක්‍රියාමාර්ග යටතේ සෙලින්කෝ ව්‍යාපාරයට අයත් ඉහත සමාගම්හි කටයුතු ඉතා ඉක්මණින් යථා තත්ත්වයට පත්වෙන ඇතැයි අපේක්ෂා කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, එම සමාගම්හි ව්‍යාපාරික කටයුතු යථා පරිදි පවත්වා ගෙන යා හැකි යැයි අපේක්ෂා කරයි. ඒ අනුව නව ක්‍රියාමාර්ග හඳුන්වා දී, මෙම ආයතන ස්ථාවර තත්ත්වයට පත්වන තුරු ඉවසිලිමත්ව සහ එම ආයතන සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කරන ලෙස ඉහත සඳහන් සමාගම් සමඟ ව්‍යාපාරික ගනුදෙනුවලට සම්බන්ධ වී ඇති පාර්ශවයන් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව අවවාද කර සිටී.

# 9. උද්ධමනය වසර පහක් තුළ එහි අඩුතම අගය කරා ළඟා වෙයි

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) (2002 100) ලක්ෂ්‍යමය වෙනස මත පදනම්ව මනිනු ලබන උද්ධමන අනුපාතය, 2009 මාර්තු මාසය වන විට සියයට 5.3 දක්වා තියුණු ලෙස පහත වැටිණි. මෙය 2004 ජනවාරි මාසයෙන් පසු වාර්තා වූ පහළ ම අගය වේ. උද්ධමන අනුපාතය මෙම පහළ ම අගයට පැමිණියේ, 2008 ජූනි මාසයේ දී වාර්තා කළ එහි ඉහළ ම අගය වූ සියයට 28.2 හි සිට මාස 9 ක් පුරා අඛණ්ඩව අඩු වෙමිනි. උද්ධමනයේ වාර්ෂික සාමාන්‍යය ද තවදුරටත් අඩු වෙමින් පසුගිය මාසයේ වූ සියයට 20.3 සිට මාර්තු මාසයේ දී සියයට 18.6 ක අගයක් දක්වා පහත වැටිණි.*

2009 මාර්තු මාසයේ දී කො.පා.මි.ද. පසුගිය මාසයට වඩා සියයට 0.4කින් අඩු විය. මෙම අඩු වීමට මුළුමනින් ම හේතු වූයේ ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ගවල මිල සියයට 1.3කින් පහළ වැටීමයි.

කෙසේ වුව ද, ලක්ෂ්‍යමය වෙනස මත, මූලික උද්ධමන අනුපාතය 2009 පෙබරවාරි මාසයේ දී පැවති සියයට 14.1 සිට 2009 මාර්තු මාසයේ දී සියයට 14.2 දක්වා සුළු වශයෙන් වැඩි වූ අතර, එහි වාර්ෂික සාමාන්‍ය ද සියයට 14.8 සිට සියයට 15.2 දක්වා වැඩි විය. මාසික මූලික උද්ධමනය සියයට 1.4කින් වැඩි වීම කෙරෙහි විනෝදාත්මක හා සංස්කෘතික කටයුතු, නිවාස හා ජලය, රෙදිපිළි හා පාවහන්, විවිධ භාණ්ඩ හා සේවා, සෞඛ්‍ය, ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ සහ නිවාස නඩත්තු කටයුතු යන උප කාණ්ඩවල මිල මට්ටම් ඉහළ යෑම මූලික වශයෙන් හේතු වී ඇත.




මුල්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් ලෙස හා ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි භාණ්ඩවල මිල ගණන් පහත වැටීම නිසා වසර මැද භාගය වනවිට මතුපිට උද්ධමනය සියයට 2-3 වැනි අඩු අගයක් කරා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 10. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.)
## 2007, 2008 සහ 2009

(2002 = 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 |
| ජනවාරි | 151.8 | 183.5 | 203.1 | 1.3 | 3.0 | -0.3 | 13.7 | 20.8 | 10.7 | 10.6 | 16.4 | 21.6 |
| පෙබරවාරි | 155.2 | 188.6 | 202.9 | 2.2 | 2.8 | -0.1 | 15.2 | 21.6 | 7.6 | 11.1 | 17.0 | 20.3 |
| මාර්තු | 155.0 | 191.9 | | -0.1 | 1.7 | | 15.1 | 23.8 | | 11.7 | 17.7 | |
| අප්‍රේල් | 156.3 | 195.4 | | 0.8 | 1.8 | | 14.3 | 25.0 | | 12.3 | 18.7 | |
| මැයි | 157.3 | 198.5 | | 0.6 | 1.6 | | 13.2 | 26.2 | | 12.6 | 19.8 | |
| ජූනි | 160.6 | 205.9 | | 2.1 | 3.7 | | 13.5 | 28.2 | | 12.8 | 21.0 | |
| ජූලි | 163.1 | 206.4 | | 1.6 | 0.2 | | 15.4 | 26.6 | | 13.3 | 21.9 | |
| අගෝස්තු | 165.2 | 206.3 | | 1.3 | 0.0 | | 16.5 | 24.9 | | 13.8 | 22.6 | |
| සැප්තැම්බර් | 166.7 | 207.2 | | 0.9 | 0.4 | | 16.1 | 24.3 | | 14.2 | 23.2 | |
| ඔක්තෝම්බර් | 171.8 | 206.6 | | 3.0 | -0.3 | | 18.2 | 20.2 | | 14.8 | 23.4 | |
| නොවැම්බර් | 176.4 | 205.2 | | 2.7 | -0.7 | | 19.3 | 16.3 | | 15.4 | 23.0 | |
| දෙසැම්බර් | 178.1 | 203.7 | | 1.0 | -0.7 | | 18.8 | 14.4 | | 15.8 | 22.6 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව